# ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සංඛ්‍යාලේඛන දත්ත පත්‍රිකාව

පත්‍රිකා අංක – 35
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ISSN 1391- 3050

**ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය – 2006 දෙවන කාර්තුව**

ශ්‍රි ලංකාවේ ශ්‍රමබලකාය, රැකියා නියුක්තිය සහ රැකියා වියුක්තිය වැනි අතිශය වැදගත් වූ සාධකයන්හි විවිධ වූ මට්ටම් සහ උපනතින් ගණනය කිරීම ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය පැවැත්වීමෙන් සිදු කරනු ලබන අගනා කර්තව්‍යයකි. 1990 වසරෙහි 1 වන කාර්තුවේ සිට ආරම්භ කරන ලද මෙම සමීක්ෂණය මගින්, සෑම වසරකම, සෑම කාර්තුවක් සඳහාම සුපුරුදු ලෙස ශ්‍රමබලය හා සම්බන්ධ වාර්තා මෙලෙස ඉදිරිපත් කර ඇත.

දෙවන කාර්තුව සඳහා ක්ෂේත්‍රයෙන් දත්ත ලබා ගැනීම 2006 අප්‍රේල් සහ මැයි මාස 2 තුල නිම කරන ලදි. 2006 වසරේ සිට උතුරු හා නැගෙනහිර පළාත්ද ආවරණය වන පරිදි සමීක්ෂණය සිදු කිරීමට අප සැලසුම්කර තිබුණද, බලාපොරොත්තු වූ දින වකවානු වලදී ජනවාරි මාසය තුල එම පළාත්වල සමීක්ෂණය ආරම්භ කිරීමට නොහැකි විය. නමුත් පෙබරවාරි මාසයේ සිට එම පළාත් වලද සමීක්ෂණය නියමිත පරිදි සිදු කිරීමට හැකිවිය. කෙසේ වෙතත්, උතුරු නැගෙනහිර පළාත්වල පැවති අයහපත් වාතාවරණය මත නියමිත දින වකවානු තුලදී සමීක්ෂණ ක්‍රියාවලිය නිමකර ගැනිමේ දුර්වලතා මතුවිය. එනිසා මෙම කාර්තුවේද ශ්‍රමබල සමීක්ෂණ ප්‍රතිඵල මගින් එම පළාත් ආවරණය වි නොමැත. නමුත් 2005 දී ශ්‍රමබල සමීක්ෂණය දිවයිනේ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කරනු ලැබිය. එහෙයින් කාර්තුමය වශයෙන් ප්‍රතිඵල සැසඳිමේ පහසුව සලකා පසුගිය වසර කිපයක තෝරාගත් ශ්‍රමබල දත්ත වාර්තා කිරීමේදී උතුරු නැගෙනහිර පළාත් හැර ප්‍රතිඵලය සටහන් කොට ඇත.

***(www.statistics.gov.lk) දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය ඔස්සේ විස්තරාත්මක දත්ත වගු පරික්ෂා කළ හැකි බව සලකන්න.***

## ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය

**ශ්‍රමබලය : අදාල යොමු සතිය තුල රැකියා නියුක්ත සහ රැකියා වියුක්ත මුළු ජනගහනය**

**ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය : ශ්‍රමබලයට අයත්වන පුද්ගලයින් සංඛ්‍යාව වයස අවුරුදු 10 සහ ඊට වැඩි ජනගහනයට ඇති අනුපාතය**

**වගුව 1: ස්ත්‍රී/පුරුෂ භාවය සහ අංශය අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශිලි ජනගහනය – 2006 2 කාර්තුව**

| අංශය | නිවාස ඒකකවල පදිංචි ජනගහනය (අවු:10 හා ඊට වැඩි) | ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | එකතුව | % | පුරුෂ | % | ස්ත්‍රී | % |
| එකතුව | 14779182 | 7549361 | 100.0 | 4809554 | 63.7 | 2739807 | 36.3 |
| නාගරික | 1931627 | 871052 | 100.0 | 605211 | 69.5 | 265841 | 30.5 |
| ග්‍රාමීය | 12847555 | 6678309 | 100.0 | 4204343 | 63.0 | 2473966 | 37.0 |

සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2006 දෙවන කාර්තුව නිමවන විට වැඩ කරන වයසේ ජනගහනය (අවු: 10 හා ඊට වැඩි) 14,779,182 ක් ලෙස වාර්තා විය. මෙයින් 7,549,361 ක් එනම් (51.0%ක්) ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය වූ අතර, පුරුෂ 64% ක් සහ ස්ත්‍රීන් 36% ක් වශයෙන් වාර්තා ලැබිණි. ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය 7,229,821 ක් ලෙස වාර්තා වූ අතර, එයින් 31% ක් පුරුෂයින් වූ අතර, 69% ක් ස්ත්‍රීන් වූහ.

**වගුව 2: ස්ත්‍රී/පුරුෂ භාවය සහ අංශය අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශිලි නොවන ජනගහනය – 2006 2 කාර්තුව**

| අංශය | නිවාස ඒකකවල පදිංචි ජනගහනය (අවු:10 හා ඊට වැඩි) | ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | එකතුව | % | පුරුෂ | % | ස්ත්‍රී | % |
| එකතුව | 14779182 | 7229821 | 100.0 | 2226470 | 30.8 | 5003351 | 69.2 |
| නාගරික | 1931627 | 1060574 | 100.0 | 306252 | 28.9 | 754322 | 71.1 |
| ග්‍රාමීය | 12847555 | 6169247 | 100.0 | 1901990 | 31.1 | 4249029 | 68.9 |

**වගුව 3 : ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය – 2000 – 2006 2 කාර්තුව**

| වසර | ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| 2000 | 50.3 | 67.2 | 33.9 |
| 2001 | 48.8 | 66.2 | 31.9 |
| 2002 | 50.3 | 67.9 | 33.6 |
| 2003 | 49.7 | 67.5 | 32.6 |
| 2004 | 49.6 | 67.2 | 33.0 |
| 2005 | 49.3 | 67.3 | 32.6 |
| 2006කා.1 | 51.7 | 69.3 | 35.5 |
| 2006කා.2 | 51.1 | 68.4 | 35.4 |


වසර 2000 සිට ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයේ හැසිරීම් රටාව වගුව 3 මගින් පෙන්නුම් කරයි. පුරුෂ පක්ෂයේ ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය 68% ක ප්‍රතිශත අගයක් වටා රැඳි ඇති අතර, ස්ත්‍රී පක්ෂය තුල 35% ක ප්‍රතිශත අගයක් වටා එම අනුපාතය රැඳි ඇති බව නිරීක්ෂණය කළ හැකිය.

**වගුව 4 : වයස් කාණ්ඩ හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය – 2006 2 කාර්තුව**

| වයස් කාණ්ඩ (අවුරුදු) | ස්ත්‍රී /පුරුෂ භාවය | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| එකතුව | 51.1 | 68.4 | 35.4 |
| 15 - 19 | 23.8 | 31.0 | 15.9 |
| 20 - 24 | 63.6 | 79.1 | 50.0 |
| 25 - 29 | 70.0 | 95.7 | 47.4 |
| 30 - 39 | 71.1 | 97.5 | 48.1 |
| 40 + | 54.7 | 75.9 | 36.1 |

වයස් කාණ්ඩ යටතේ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය වගුව 4 න් විස්තර කරයි. වයස අවුරුදු 30–39 අතර පුරුෂයින්ගේ උපරිම ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයක් දක්නට ලැබෙන අතර, එහි අගය 97.5% කි. ස්ත්‍රීන්ගේ උපරිම ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයක් වාර්තා වන්නේ වයස අවුරුදු 20–24 අතර කාණ්ඩයෙනි. එහි අගය 50% කි.

**රූපය 1 : ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය – 2006 2 කාර්තුව**



# රැකියා නියුක්තිය

**රැකියා නියුක්තිය : අදාල යොමු සතිය තුල, වැටුප් හෝ ලාභ පිණිස හෝ පවුලට ආදායමක් ලැබීම සඳහා කිසියම් වැඩක නියැලුණු පුද්ගලයින් ගණන**


***2006 වසරේ 2 කාර්තුව තුලදී ඇස්තමේන්තු ගත මුළු රැකියා නියුක්තිකයින් ගණන 7,073,844 කි. එයින් 4,572,623 ක් පුරුෂ පක්ෂය වූ අතර, 2,501,221 ක් ස්ත්‍රීන් වූවාය.***

**වගුව 5 : සේවයේ නියුතු ප්‍රධාන කර්මාන්තය සහ සේවා තත්වය අනුව රැකියා නියුක්ති ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය 2006 2 කාර්තුව**

| සේවා තත්වය | ප්‍රධාන කර්මාන්ත අංශය | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | | කෘෂිකර්මාන්තය | | කෘෂිකර්මාන්ත නොවන | |
| | ගණන | % | ගණන | % | ගණන | % |
| එකතුව | 7073844 | 100.0 | 2423036 | 34.3 | 4650809 | 65.7 |
| සේවක | 3915618 | 100.0 | 714105 | 18.2 | 3201513 | 81.8 |
| සේවායෝජක | 213307 | 100.0 | 26489 | 12.4 | 186818 | 87.6 |
| තමාගේම වැඩ කටයුතු | 2161808 | 100.0 | 1080119 | 50.0 | 1081689 | 50.0 |
| වැටුප් නොලබා පවුලේ | 783111 | 100.0 | 602323 | 76.9 | 180788 | 23.1 |

කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන කර්මාන්ත තුල විවිධ සේවා තත්ව යටතේ රැකියා නියුක්තවූවන්ගේ ව්‍යාප්තිය 5 වන වගුවෙන් විස්තර කර ඇත. සමස්ත ඇස්තමේන්තු ගත රැකියා නියුක්තිකයන් ගෙන් 66% ක් කෘෂිකාර්මික නොවන කර්මාන්ත තුල සේවයේ යෙදී ඇති අතර, ඉතිරි 34% කෘෂිකර්මාන්ත ආශ්‍රිත රැකියා නියුක්තියන් විය.

**රූපය 2: සේවයේ නියුතු කර්මාන්තය සහ සේවා තත්වය අනුව රැකියා නියුතු ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය – 2006 2 කාර්තුව**




වැටුප් නොලබා පවුලේ වැඩ කටයුතු වලට දායකවෙමින් කෘෂි කර්මාන්ත අංශයේ රැකියා නියුක්තව සිටින ප්‍රතිශතය 77% ක් වන අතර, ඉතිරි 23% කෘෂිකාර්මික නොවන අංශයේ රැකියාවල නිරතවී සිටී.

**වගුව 8 ස්ත්‍රී / පුරුෂ භාවය අනුව අ.පො.ස. (උ.පෙල) හා ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් සහිත රැකියා නියුක්තිකයින්ගේ ප්‍රතිශත ව්‍යාප්තිය – (1990 සිට 2006 2 කාර්තුව දක්වා)**

| වසර | | ස්ත්‍රී / පුරුෂ භාවය | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| 1990 | 7.0 | 5.9 | 9.3 |
| 1991 | 7.9 | 7.5 | 8.8 |
| 1992 | 8.7 | 7.4 | 11.9 |
| 1993 | 9.5 | 7.7 | 13.5 |
| 1994 | 8.8 | 7.2 | 12.6 |
| 1995 | 10.3 | 8.4 | 14.3 |
| 1996 | 10.3 | 8.4 | 14.7 |
| 1997 | 10.5 | 8.7 | 14.4 |
| 1998 | 11.0 | 9.2 | 14.3 |
| 1999 | 10.9 | 9.0 | 15.0 |
| 2000 | 11.9 | 9.8 | 16.1 |
| 2001 | 13.5 | 11.4 | 18.0 |
| 2002 | 14.0 | 11.4 | 19.4 |
| 2003 | 13.7 | 11.2 | 19.0 |
| 2004 | 14.6 | 12.2 | 19.6 |
| 2005 | 16.0 | 13.2 | 21.7 |
| 2006 කා. 1 | 13.8 | 12.3 | 16.7 |
| 2006 කා. 2 | 13.4 | 11.3 | 17.2 |

**වගුව 6 : සේවයේ නියුතු ප්‍රධාන කර්මාන්තය සහ අංශය අනුව රැකියා නියුක්තිය 2006 2 කාර්තුව**

| අංශය | එකතුව | | ප්‍රධාන කර්මාන්ත අංශය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කෘෂිකර්ම | | නිෂ්පාදන | | සේවා | |
| | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % |
| එකතුව | 7073844 | 100.0 | 2423036 | 34.3 | 1791226 | 25.3 | 2859583 | 40.4 |
| නාගරික | 815273 | 100.0 | 33513 | 4.1 | 216448 | 26.5 | 565313 | 69.3 |
| ග්‍රාමීය | 6258571 | 100.0 | 2389523 | 38.2 | 1574778 | 25.2 | 2294270 | 36.7 |

**වගුව 7 : ස්ත්‍රී / පුරුෂ භාවය සහ සේවයේ නියුතු ප්‍රධාන කර්මාන්තය අනුව රැකියා නියුක්තිය – 2006 2 කාර්තුව**

| ස්ත්‍රී/පුරුෂ භාවය | එකතුව | | ප්‍රධාන කර්මාන්ත අංශය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කෘෂිකර්ම | | නිෂ්පාදන | | සේවා | |
| | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % |
| එකතුව | 7073844 | 100.0 | 2423036 | 34.3 | 1791226 | 25.3 | 2859583 | 40.4 |
| පුරුෂ | 4572623 | 99.9 | 1427732 | 31.2 | 1158848 | 25.3 | 1986043 | 43.4 |
| ස්ත්‍රී | 2501221 | 100.0 | 995304 | 39.8 | 632378 | 25.3 | 873540 | 34.9 |

වගුව 7 න් පැහැදිලිවන කරුණක් වන්නේ රැකියා නියුක්තිකයින් අතර, පුරුෂයින්ට වඩා වැඩි ප්‍රතිශතයකින් ස්ත්‍රීන් කෘෂිකර්මාන්තයේ නියැලී ඇති බවයි. රැකියා නියුක්තික ස්ත්‍රීන්ගෙන් 40% ක්ම කෘෂිකාර්මික අංශයේ රැකියා නියුක්තිකයින් වේ.


සටහන :
A,B,C.......Q වශයෙන් සඳහන් කරනු ලබන මෙම වර්ගිකරණය ජාත්‍යන්තර වර්ගීකරණය ISIC (Rev3) අනුව සකස් වී ඇත.

**කෘෂිකාර්මික :**
1. කෘෂිකාර්මික (A)
2. ධිවර හා වන (B)

**නිෂ්පාදන කර්මාන්ත :**
1. නිෂ්පාදන
2. ඉදිකිරීම්
3. පතල් සහ කැණීම්
4. විදුලිය, ගෑස් සහ ජල සම්පාදනය

**සේවා :**
1. තොග හා සිල්ලර වෙළඳම, මෝටර් රථ, යතුරු පැදි සහ ගෘහ උපකරණ අළුත්වැඩියාව.
2. හෝටල් සහ නවාතැන්පලවල්
3. ගමනාගමනය, ගබඩා සහ පණිවුඩ හුවමාරුව.
4. මූල්‍ය ගනුදෙනු, දේපල වෙළඳම, කුලියට දීමේ ව්‍යාපාරික සේවා.
5. රාජ්‍ය පරිපාලන, ආරක්ෂක සහ අත්‍යාවශ්‍ය සේවා රාජකාරි
6. අධ්‍යාපනය
7. සෞඛ්‍ය සහ සමාජ සේවා
8. වෙනත් මානව සමාජ සහ පොදුසේවා
9. ගෘහ සේවාවල නියුතුවූවන්
10. තැනින් තැන ඇවිද කුලි වැඩ කරන්නන්
11. වෙනත් ප්‍රාදේශීය සංවිධාන
12. ප්‍රමාණවත් ලෙස විස්තර නොවුණු කර්මාන්ත

**රූපය 3 : ස්ත්‍රී / පුරුෂ භාවය අනුව අ.පො.ස. (උ.පෙල) හා ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් සහිත රැකියා නියුක්තිකයින්ගේ ප්‍රතිශත ව්‍යාප්තිය – (1990 – 2006 2 කාර්තුව දක්වා)**




අ.පො.ස. (උ.පෙළ) හා ඊට වැඩි සුදුසුකම් සහිතව රැකියා නියුතු ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය 1990 සිට 2005 වසර දක්වා පැහැදිලිව ක්‍රමික ක්‍රමානුකූල වැඩිවීමක් පෙන්නුම් කරයි. 1990 වසරේ 9.3% ක් වූ මෙම අගය 2005 වසරේ 21.7% ක් දක්වා ඉහළ ගොස් තිබුණි. කෙසේ වෙතත් 2006 වසර වන විට මෙම ප්‍රතිශත අගයේ අඩුවීමක් සමීක්ෂණ වාර්තා පෙන්නුම් කරයි.

# විරැකියාව


**විරැකියා අනුපාතය : රැකියා වියුක්ත පුද්ගලයින් සංඛ්‍යාව, ශ්‍රමබලකායට ඇති අනුපාතයේ ප්‍රතිශතය**

**රැකියා විරහිත පුද්ගලයින් : යොමු සතිය තුළ රැකියාවක් සොයමින් සිටි අය සහ රැකියාවක් බලාපොරොත්තුවෙන් රැකියාවක් නොමැතිව සිටි පුද්ගලයින් ගණන**

**වගුව 9 : ස්ත්‍රී / පුරුෂ භාවය අනුව විරැකියා අනුපාතය (2000 සිට 2006 2 කාර්තුව දක්වා)**

| වසර | විරැකියා අනුපාතය | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| 2000 | 7.6 | 5.8 | 11.1 |
| 2001 | 7.9 | 6.2 | 11.5 |
| 2002 | 8.8 | 6.6 | 12.9 |
| 2003 | 8.1 | 6.0 | 12.3 |
| 2004 | 8.1 | 6.0 | 12.1 |
| 2005 | 7.2 | 5.3 | 10.7 |
| 2006 කා.1 | 7.2 | 5.5 | 10.1 |
| 2006 කා.2 | 6.3 | 4.9 | 8.7 |

**රූපය 3 : ස්ත්‍රී / පුරුෂ භාවය අනුව පසුගිය වසරවල සිට විරැකියා අනුපාතය**




2006 2 කාර්තුවේදී සමස්ත විරැකියා අනුපාතය 6.3% කි. ක්‍රමයෙන් පහළ මට්ටමකට පිවිසෙමින් සිටින විරැකියා අනුපාතය 2006 2 කාර්තුවේදී අවම අගයකට පැමිණ තිබේ.


**වගුව 10 : ස්ත්‍රී / පුරුෂ භාවය සහ රැකියා නියුක්ත සහ රැකියා වියුක්ත පුද්ගලයින් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් අනුව ප්‍රතිශත ව්‍යාප්තිය – 2006 2 කාර්තුව**

| ස්ත්‍රී/පුරුෂ භාවය සහ අංශය | එකතුව | අධ්‍යාපන මට්ටම | | |
|---|---|---|---|---|
| | | අ.පො.ස. (සා.පෙ.)දක්වා | අ.පො.ස. (සා.පෙ.)සමත් | අ.පො.ස(උ.පෙ.). හා ඊට වැඩි |
| රැකියා නියුතු පුද්ගලයින් | 100.0 | 69.8 | 16.9 | 13.4 |
| පුරුෂ | 100.0 | 72.3 | 16.4 | 11.3 |
| ස්ත්‍රී | 100.0 | 65.1 | 17.7 | 17.2 |
| රැකියා වියුක්ත පුද්ගලයින් | 100.0 | 47.7 | 28.8 | 23.5 |
| පුරුෂ | 100.0 | 56.2 | 27.8 | 15.9 |
| ස්ත්‍රී | 100.0 | 39.2 | 29.7 | 31.1 |

ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් වලට ප්‍රමාණාත්මකව රැකියා නියුක්ත සහ රැකියා විරහිත පුද්ගලයින් පිළිබඳ නිරීක්ෂණය කිරීමේදී වැඩිදුර අධ්‍යාපනය ලබා රැකියා නියුතුව සිටින පුද්ගලයින්ගේ ප්‍රතිශතයට වඩා එම අධ්‍යාපන සුදුසුකම් සහිතවම රැකියා විරහිතව පසුවන පුද්ගලයින් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස වැඩි බව දක්නට ලැබේ. අ.පො.ස. (සා.පෙළ.) සහ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් සපුරා රැකියා නියුතුව සිටින පුද්ගලයින් ප්‍රතිශතයක් ලෙස 30.3% කි. එම සුදුසුකම් සහිතව 52.3% ක් රැකියා විරහිතව පසුවන බවද සමීක්ෂණ වාර්තා හෙළි කරයි.

රැකියා විරහිත කාන්තාවන්ගෙන් 60.8% ක් අ.පො.ස.(සා.පෙළ.) හා ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අතර, රැකියා විරහිත පුරුෂයින් ගෙන් එම අධ්‍යාපන මට්ටම සපුරා ඇත්තේ 43.7% ක් පමණි.


***රූපය 4 : ස්ත්‍රී / පුරුෂ භාවය සහ වයස් කාණ්ඩ අනුව විරැකියා අනුපාතය***




**වගුව 11 : ස්ත්‍රී / පුරුෂ භාවය සහ වයස් කාණ්ඩ අනුව විරැකියා අනුපාතය – 2006 2 කාර්තුව**

| වයස් කාණ්ඩ | ස්ත්‍රී/පුරුෂ භාවය | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| ශ්‍රී ලංකාව | 6.3 | 4.9 | 8.7 |
| 15 - 19 | 23.3 | 22.0 | 26.0 |
| 20 - 24 | 20.6 | 15.5 | 27.8 |
| 25 - 29 | 10.1 | 7.0 | 15.7 |
| 30+ | 1.7 | 1.4 | 2.3 |

***රූපය 5 : ස්ත්‍රී / පුරුෂ භාවය සහ වයස් කාණ්ඩ අනුව විරැකියා ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය – 2006 2 කාර්තුව***




ජාතික විරැකියා අනුපාතය 6.3% ක් වැනි පහළ අගයක පැවතුනද, වයස අවු : 15–19 සහ 20–29 වයස් කාණ්ඩයේ පසුවන අය අතර විරැකියා අනුපාතය ඉහළ අගයක් ගෙන තිබේ.

විරැකියා ජනගහනයෙන් 40% ක්ම වාර්තා වන්නේ 20–24 වයස් කාණ්ඩයෙනි.

විරැකියාවෙන් යුතු කාන්තාවන් ගෙන් 46% ක්ම මෙම වයස් කාණ්ඩය තුළ පසුවන අය වන අතර, රැකියා විරහිතව පසුවන පිරිමි අයගෙන් 36% ක් පසුවන්නේද මෙම වයස් කාණ්ඩය තුළ බව සමීක්ෂණ වාර්තා හෙළි කරයි.

# තෝරාගත් ශ්‍රමබල දර්ශකයන් (උතුරු හා නැගෙනහිර පළාත් හැර)

**( 1996 - 2006 දෙවන කාර්තුව)**

| | වසර | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1996 | 1998 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 කා.1 | 2006 කා.2 |
| **ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය** | | | | | | | | | | |
| **ස්ත්‍රී / පුරුෂ භාවය අනුව** | | | | | | | | | | |
| දෙපාර්ශ්වයම | 48.6 | 51.7 | 50.3 | 48.8 | 50.3 | 49.7 | 49.6 | 49.3 | 51.7 | 51.1 |
| පුරුෂ | 65.9 | 67.5 | 67.2 | 66.2 | 67.9 | 67.5 | 67.2 | 67.3 | 69.3 | 68.4 |
| ස්ත්‍රී | 31.6 | 36.4 | 33.9 | 31.9 | 33.6 | 32.6 | 33.0 | 32.6 | 35.5 | 35.4 |
| **පදිංචි ප්‍රදේශය අනුව** | | | | | | | | | | |
| එකතුව | 48.6 | 51.7 | 50.3 | 48.8 | 50.3 | 49.7 | 49.6 | 49.3 | 51.7 | 51.1 |
| නාගරික | 44.4 | 45.2 | 44.9 | 44.2 | 46.0 | 45.1 | 45.6 | 46.2 | 46.3 | 45.1 |
| ග්‍රාමීය | 49.5 | 52.7 | 51.2 | 49.6 | 50.9 | 50.3 | 50.3 | 49.7 | 52.5 | 52.0 |
| **විරැකියා අනුපාතය** | | | | | | | | | | |
| **ස්ත්‍රී / පුරුෂ භාවය අනුව** | | | | | | | | | | |
| දෙපාර්ශ්වයම | 11.3 | 9.2 | 7.6 | 7.9 | 8.8 | 8.1 | 8.1 | 7.2 | 7.2 | 6.3 |
| පුරුෂ | 8.2 | 6.5 | 5.8 | 6.2 | 6.6 | 6.0 | 6.0 | 5.3 | 5.5 | 4.9 |
| ස්ත්‍රී | 17.7 | 14.0 | 11.1 | 11.5 | 12.9 | 12.3 | 12.1 | 10.7 | 10.1 | 8.7 |
| **තෝරාගත් වයස් කාණ්ඩ අනුව (අවුරුදු)** | | | | | | | | | | |
| 20 - 29 | 22.0 | 19.3 | 17.4 | 18.4 | 20.1 | 19.1 | 18.6 | 16.0 | 16.8 | 15.3 |
| 20 - 24 | 29.1 | 25.4 | 23.0 | 24.4 | 27.0 | 25.8 | 25.2 | 22.4 | 22.4 | 20.6 |
| 25 - 29 | 14.4 | 12.4 | 10.9 | 11.3 | 11.6 | 11.4 | 11.1 | 9.4 | 11.3 | 10.1 |
| **තෝරාගත් අධ්‍යාපන මට්ටම් අනුව** | | | | | | | | | | |
| **අ.පොස.(උ.පෙළ.) සහ ඉන් ඉහළ** | | | | | | | | | | |
| දෙපාර්ශ්වයම | 19.0 | 17.5 | 14.9 | 15.3 | 16.8 | 16.0 | 15.7 | 12.2 | 12.1 | 10.6 |
| පුරුෂ | 10.1 | 9.4 | 8.8 | 10.1 | 10.8 | 10.1 | 9.6 | 7.9 | 6.8 | 6.8 |
| ස්ත්‍රී | 28.3 | 25.8 | 21.5 | 21.5 | 23.0 | 22.4 | 22.5 | 17.1 | 18.6 | 14.7 |
| **රැකියා නියුක්ත ජනගහනය** | | | | | | | | | | |
| **ස්ත්‍රී / පුරුෂ භාවය අනුව** | | | | | | | | | | |
| දෙපාර්ශ්වයම | 5536216 | 6049388 | 6310247 | 6235588 | 6519415 | 6609466 | 6704006 | 6788119 | 7081435 | 7073844 |
| පුරුෂ | 3856411 | 4004621 | 4241546 | 4248877 | 4395164 | 4496136 | 4512082 | 4546397 | 4634156 | 4572623 |
| ස්ත්‍රී | 1679805 | 2044767 | 2068701 | 1986711 | 2124250 | 2113330 | 2191924 | 2241722 | 2447279 | 2501221 |
| **සේවයේ නියුතු කර්මාන්තය (ප්‍රතිශතයක් ලෙස)** | | | | | | | | | | |
| එකතුව | 5536216 | 6049388 | 6310247 | 6235588 | 6519415 | 6609466 | 6704006 | 6788119 | 7081435 | 7073844 |
| % | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) | (100.0) |
| කෘෂිකර්මාන්තය | 2071764 | 2378572 | 2274153 | 2033343 | 2247602 | 2223691 | 2215282 | 2059293 | 2346321 | 2423036 |
| % | (37.4) | (39.3) | (36.0) | (32.6) | (34.5) | (33.6) | (33.0) | (30.3) | (33.1) | (34.3) |
| නිෂ්පාදන කර්මාන්තය | 1217977 | 1325735 | 1490795 | 1491408 | 1459194 | 1539035 | 1663383 | 1787274 | 1862896 | 1791226 |
| % | (22.0) | (21.9) | (23.6) | (23.9) | (22.4) | (23.3) | (24.8) | (26.3) | (26.3) | (25.3) |
| සේවා | 2246475 | 2345081 | 2545299 | 2710837 | 2812619 | 2846740 | 2825341 | 2941552 | 2872217 | 2859583 |
| % | (40.6) | (38.8) | (40.3) | (43.5) | (43.1) | (43.1) | (42.1) | (43.3) | (40.6) | (40.4) |
| ***සතියකට වැඩ කරන පැය ගණන අනුව (ප්‍රතිශතයක් ලෙස)*** | | | | | | | | | | |
| එකතුව | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |
| 0 • | 4.9 | 5.3 | 7.2 | 4.3 | 5.6 | 7.3 | 5.3 | 4.9 | 4.5 | 9.6 |
| 1 - 9 | 1.8 | 2.3 | 1.9 | 1.5 | 1.5 | 1.8 | 1.7 | 1.6 | 2.6 | 2.0 |
| 10 - 39 | 32.0 | 32.9 | 32.7 | 28.2 | 32.0 | 32.9 | 28.4 | 27.9 | 30.8 | 28.1 |
| 40+ | 61.3 | 59.6 | 58.2 | 66.1 | 60.9 | 58.0 | 64.7 | 65.7 | 62.1 | 60.3 |

• රැකියාවක් තිබූ නමුත් යොමු කාලය තුල රැකියාවෙහි යෙදී නොමැත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 15/12, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07
දුරකථන : 2695291, ෆැක්ස් : 94-11-2697594, ඊමේල් : sample.survey @ statistics.gov.lk
අන්තර්ජාලය: www.statistics.gov.lk